17
SEP

Non-Academic Vacancies (Open Recruitments) – University of Sri Jayewardenepura

17TH SEPTEMBER 2026 / UNCATEGORISED, VACANCIES

පුරප්පාඩු

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මෙම විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් **2026.09.17** දින පෙ.ව. **8.30** සිට **2026.10.01** දින ප.ව. **4.00** දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

පුහුණුවන තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය ‘ආ’ ඛණ්ඩය
TRAINEE TECHNICAL OFFICER (GRADE II (SEG B))

සුදුසුකම් :-

1. **අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යා අංශය හෝ භෞතික විද්‍යා අංශය හෝ තාක්ෂණවේදී අංශය යටතේ එක් වරකදී විෂයයන් තුනක් (03) සමත් විය යුතුය.**

සහ

2. **මෙම තනතුරට අදාළ අවම වයසයෙන් වසරක පූර්ණ කාලීන කුසලතා මත පදනම් වූ විධිමත් පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම. මෙම තනතුර සඳහා පුහුණු පාඨමාලාව අදාළ පීඨයේ පිළිගැනීම මත තීරණය වේ.**

වැටුප් පරිමාණය :- රු. 51,095-7×540; 10×640- 60,575 (මාසික) U-MT 1(III)

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- **ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්**

වයස :– අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

සැලසුම් ශිල්පී (පහළ ශ්‍රේණිය)
DRAUGHTSMAN (LOWER GRADE)

සුදුසුකම් :-

1. රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක සැලසුම් ශිල්පය පිළිබඳ පරීක්ෂණය සමත්ව තිබීම.

වැටුප් පරිමාණය :- රු. 51,095-7×540; 10×640- 60,575 (මාසික) U-MT 1(III)

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස :– අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

හෙද නිලධාරී (II ශ්‍රේණිය)
NURSING OFFICER (GRADE II)

සුදුසුකම් :-

1. දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිතව, විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් විය යුතුය.

සහ

2. හෙදියක වශයෙන් ප්‍රවීණතාව ලබා ඇති බවට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පිළිගත් සහතිකයක් තිබිය යුතුය.

වැටුප් පරිමාණය :- රු. 51,095-7×540; 10×640- 60,575 (මාසික) U-MT 1(III)

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස :– අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

මහජන සෞඛ්‍ය පරීක්ෂක (III ශ්‍රේණිය)
PUBLIC HEALTH INSPECTOR (GRADE III)

සුදුසුකම් :-

1. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක විභාගය සමත් වීම.

වැටුප් පරිමාණය :- රු. 51,095-7×540; 10×640- 60,575 (මාසික) U-MT 1(III)

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස :– අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

තාක්ෂණික නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය
TECHNICAL OFFICER (CIVIL) (GRADE III)

සුදුසුකම් :-

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂය ධාරාවෙන් හෝ තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය (ET) / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදය (ICT) යන විෂයයන්ගෙන් එක් වරකදී විෂයයන් තුනකින් (03) සමත් වී තිබීම.

සහ

2. සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ හෝ ඊට සමාන ක්ෂේත්‍රයක තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකමේ 5 වන මට්ටම (NVQ Level 5) හෝ ඊට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වැටුප් පරිමාණය :- රු. 51,095-7×540; 10×640- 60,575 (මාසික) U-MT 1(III)

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස :– අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

පරිපාලක (සිවිල්) III ශ්‍රේණිය
SUPERVISOR (CIVIL) (GRADE III)

සුදුසුකම් :-

1. ජාතික තාක්ෂණ සහතිකපත්‍ර (NCT) හෝ ඊට සමාන සුදුසුකම් සමඟ NCT පාඨමාලාව හදාරන අතරතුර ලබාගත් වසර 03 ක පළපුරුද්ද;

හෝ

2. රජයේ, පළාත් පාලන හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පරිපාලකවරයෙකු ලෙස අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද සහිතව, දෙවරකට (02) නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

වැටුප් පරිමාණය :- රු. 49,475-17×540 – 58,655 (මාසික) U-MN 1(III)

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මඟින්

වයස :– අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

පරිපාලක (විදුලි) III ශ්‍රේණිය
SUPERVISOR (ELECTRICAL) (GRADE III)

සුදුසුකම් :-

1. ජාතික තාක්ෂණ සහතිකපත්‍ර (NCT) හෝ ඊට සමාන සුදුසුකම් සමඟ NCT පාඨමාලාව හදාරන අතරතුර ලබාගත් වසර 03 ක පළපුරුද්ද;

හෝ

2. රජයේ, පළාත් පාලන හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පරිපාලකවරයෙකු ලෙස අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද සහිතව, දෙවරකට (02) නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

වැටුප් පරිමාණය :- රු. 49,475-17×540 – 58,655 (මාසික) U-MN 1(III)

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මඟින්

වයස :– අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

පරිපාලක (භූමි දර්ශක) III ශ්‍රේණිය
SUPERVISOR (LANDSCAPE) (GRADE III)

සුදුසුකම් :-

(අ)

1. දෙවරකට (02) කට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

සහ

2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන වසරක ප්‍රායෝගික කෘෂිකාර්මික පුහුණු පාඨමාලාව හෝ ඊට සමාන පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

වැටුප් පරිමාණය :- රු. 49,475-17×540 – 58,655 (මාසික) U-MN 1(III)

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මඟින්

වයස :– අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වෘත්තීය ශිල්ප ප්‍රදර්ශක (වෑද්දුම්) II ශ්‍රේණිය
CRAFT DEMONSTRATOR (FITTING) (GRADE II)

සුදුසුකම් :-

1. පහත සඳහන් ක්ෂේත්‍ර එකක හෝ ඊට වැඩි ගණනක පළපුරුද්ද තිබිය යුතුය.

වාත්තු වැඩ, පෑස්සුම් සහ කම්හල් වැඩ, යාන්ත්‍රික උපාංග, රථා සැකසීම, තහඩු වැඩ, වඩු වැඩ, ලෝහ වැඩ.

සටහන : ඉහත සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් එකකට වැඩි ගණනක් සඳහා පළපුරුද්ද ඇති අය කෙරෙහි ප්‍රමුඛත්වය දක්වනු ලැබේ.

සහ

2. විශ්වවිද්‍යාලයක / රාජ්‍ය සේවයේ හෝ පිළිගත් ආයතනයක පුහුණු ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

3. විශ්වවිද්‍යාලයක / රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර තුනක කාලයක් ඉහත අංක එක (i) යටතේ සඳහන් විෂය ක්ෂේත්‍රයක විශේෂ ශ්‍රේණියේ පුහුණු ශිල්පියෙකු වශයෙන් සේවයේ යෙදී තිබීම.

වැටුප් පරිමාණය :- රු. 49,475-17×540 – 58,655 (මාසික) U-MN 1(III)

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

වයස :– අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

පිහිනුම් තටාක සුපරීක්ෂක (III ශ්‍රේණිය)
SWIMMING POOL SUPERVISOR (GRADE III)

සුදුසුකම් :-

1. සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යය සහ ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ පහක් (05) සහිතව වාර දෙවරකට (02) නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

2. අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් දෙකක් (02) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.

මීට අමතරව අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතු තනතුරට සුවිශේෂ වූ කුසලතා

පිළිගත් ආයතනයක් හෝ සංගමයක් මඟින් පහත සඳහන් කුසලතා පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය.

(අ) පිහිනීම සහ මූලික පිහිනුම් ක්‍රම 4ක් (Four basic swimming strokes) ඉගැන්වීමේ හැකියාව.

(ආ) ප්‍රථමාධාර සහ ජීවිත ආරක්ෂක.

(ඇ) පරිගණක සාක්ෂරතාවය අමතර සුදුසුකමක් වේ.

වැටුප් පරිමාණය :- රු. 49,475-17×540 – 58,655 (මාසික) U-MN 1(III)

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

වයස :– අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

රියදුරු III ශ්‍රේණිය
DRIVER (GRADE III)

සුදුසුකම් :-

1. අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02)ක් සහිතව උපරිම වාර දෙකකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයේ විෂයයන් හයක් (06) සමත්ව තිබීම.

සහ

2. බර වාහන පැදවීමේ දක්ෂතාවය පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් තිබිය යුතු අතර, බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම පිළිබඳ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය.

වෙනත් :

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

වැටුප් පරිමාණය :- රු. **48,005 – 16×490 – 55,845 (මාසික) U–PL 3(III)**

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :– වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස :– අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

පෑස්සුම්කරු (III ශ්‍රේණිය)
WELDER (GRADE III)

සුදුසුකම් :

1. පෑස්සුම්කරු විෂය ක්ෂේත්‍රයට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ Level) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වෙනත් :

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

වැටුප් පරිමාණය :- රු. 48,005 – 16x490 – 55,845 (මාසික) U-PL 3(III)

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :– වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස :– අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

විද්‍යාගාර සහායක (III ශ්‍රේණිය)
LABORATORY ATTENDANT (GRADE III)

සුදුසුකම් :

1.

(අ) අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ විද්‍යාගාර සහයක තනතුරට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකමේ NVQ Level 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා

තිබීම.

හෝ

(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්වී තිබීම සහ විද්‍යාගාර ක්ෂේත්‍රයේ කාර්මික නිපුණතා සහිතව වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

වෙනත්:

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

වැටුප් පරිමාණය :- රු. 44,575 – 16x490 – 52,415 (මාසික) U-PL 2(III)

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :– වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස :– අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

ලේත් යන්ත්‍ර ක්‍රියාකරු (III ශ්‍රේණිය)
LATHE MACHINE OPERATOR (GRADE III)

සුදුසුකම් :

1.

(අ) අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ ලේත් යන්ත්‍ර ක්‍රියාකරු තනතුරට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකමේ NVQ Level 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්වී තිබීම සහ ලේත් යන්ත්‍ර ක්ෂේත්‍රයේ කාර්මික නිපුණතා සහිතව වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

වෙනත්:

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

වැටුප් පරිමාණය :- රු. 44,575 – 16x490 – 52,415 (මාසික) U-PL 2(III)

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :– වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස :– අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

නිදර්ශක එකතුකරන්නා (III ශ්‍රේණිය)
SPECIMEN COLLECTOR (GRADE III)

සුදුසුකම් :

1. අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ නිදර්ශක එකතුකරන්නා තනතුරට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකමේ NVQ 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

2. අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්වී තිබීම සහ නිදර්ශක එකතුකරන්නා විෂය ක්ෂේත්‍රයේ කාර්මික නිපුණතා සහිතව වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

වෙනත්:

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

වැටුප් පරිමාණය :- රු. 44,575 – 16x490 – 52,415 (මාසික) U-PL 2(III)

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :– වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස :– අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අයදුම්කරුවන් තම ඉපයීම් වලින් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මඟින් එකී ඉපයීම් වලින් 7% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලට හා 8% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරනු ලැබේ. එයට අමතරව 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මඟින් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.

ජාතික වෘත්තීය සුදුසුකම අදාළ වන තනතුරු සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) තහවුරු කිරීමට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commission) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය මඟින් පමණක් ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත ද්වාරය (Online Portal) **2026.09.17** දින පෙ.ව. **8.30** සිට **2026.10.01** දින ප.ව. **4.00** දක්වා විවෘතව පවතිනු ඇත. වැඩි විස්තර https://www.sjp.ac.lk/vacancies වෙබ් පිටුව මඟින් ලබා ගත හැකි අතර මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා https://hrms.sjp.ac.lk/vacancies/nonacademic/open වෙත පිවිසිය යුතුය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/විශ්වවිද්‍යාලයක/උසස් අධ්‍යාපන ආයතනයක/රාජ්‍ය දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කරන අයදුම්කරුවන් අයදුම් කරන ලද තනතුරට තේරී පත්වුවහොත් තමා සේවය කරන ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවට වූ තම ආයතනයේ ප්‍රධානී සහතිකය අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ උඩුගත (Upload) කළ යුතුය.

සෑම අයදුම්කරුවෙක්ම තමා විසින් අයදුම් කරනු ලබන සෑම තනතුරක් සඳහාම වෙන් වෙන් වශයෙන් ආපසු නොගෙවන පදනම මත රු.

1000.00 ක අයදුම්පත් ගාස්තුවක් ගෙවිය යුතුය. මෙම ගෙවීම මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ණයපත් / හරපත් (Credit/Debit Card) මඟින් සෘජුවම කළ හැකිය.

ඔබ මෙම ගෙවීම මහජන බැංකු ශාඛාවක් මඟින් සිදු කරන්නේ නම් මාර්ගගත අයදුම්පත අවසානයේ දක්වා ඇති පරිදි බැංකු පෝරමය (Bank Slip) පිරවිය යුතු අතර, **එම බැංකු පෝරමයේ ඇති හේතුව (Purpose) සඳහා අයදුම්පතට අදාළ අනන්‍ය (Unique) ගෙවීම් යොමු අංකය (Payment Reference No.) සටහන් කිරීම අනිවාර්ය වේ.** පසුව එම බැංකු පෝරම උඩුගත (Upload) කළ යුතු අතර ඒ සඳහා පහසුකම් සලසා ඇත.

මෙම ගෙවීම මාර්ගගත බැංකු හර කිරීම් (Bank Transfer) හරහා සිදුකිරීම **නොකළ** යුතු බව කරුණාවෙන් සලකන්න.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම, සුදුසුකම් හා පලපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතික වල පිටපත් උඩුගත (Upload) කර නොතිබීම, නියමිත අයදුම්පත් ගාස්තුව ගෙවා නොතිබීම, අයදුම්පතට අදාළ අනන්‍ය ගෙවීම් අංකය (Payment Reference No.) සඳහන් කර නොමැති බැංකු පෝරම උඩුගත (Upload) කර තිබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. යම් තනතුරක් සඳහා අයදුම්පත් විශාල සංඛ්‍යාවක් ලැබුණු අවස්ථාවක අවස්ථාවෝචිත ක්‍රමයක් අනුගමනය කරමින් අයදුම්කරුවන් සීමා කිරීමක් සිදුවේ.

කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බැලීම සිදු නොකෙරේ.

විමසීම් සඳහා රාජකාරී දිනවල **පෙ.ව. 08.30** සිට **ප.ව. 4.00** දක්වා 0112758212/102 දුරකථන අංක ඔස්සේ ඇමතිය හැක.

ලේඛකාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.
2026.09.16

Apply Now!